මගේ අංකය: PS/SD/GS/උපදෙස් පත්‍රිකා 2018(5)
තිරසර සංවර්ධන අංශය,
ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය.

2018.10.04

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිසාපතිවරුන් මගින්
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

දිස්ත්‍රික් ලේකම්තුමනි,
ප්‍රාදේශීය ලේකම්තුමනි,

**<u>ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ලබාදෙන ප්‍රතිපාදන ග්‍රාමශක්ති සමිති මගින් වියදම් කිරිමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග</u>**

2018 වර්ෂය සඳහා ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය මගින් ලියාපදිංචි ග්‍රාමශක්ති සමිති වෙත ලබාදීම සඳහා එක් ග්‍රාම නිලධාරි වසමකට රුපියල් මිලියන එක බැගින් වූ ප්‍රතිපාදන මේ වනවිට ඔබ වෙත ලබාදී ඇත. මෙම ප්‍රතිපාදන වලින් ධාරිතා සංවර්ධනයට අදාළ ප්‍රතිපාදන මගේ අංක PS/SD/GS/උපදෙස් පත්‍රිකා 2018(4) හා 2018.09.18. දිනැති ලිපිය මගින් මුදාහැරිමට උපදෙස් ලබාදී ඇත.

ජීවනෝපාය සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ප්‍රතිපාදන ද ලියාපදිංචි ග්‍රාමශක්ති සමිති වෙත මුදාහැරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

සමිති ගිණුම්වලට ලබාදෙන රජයේ අරමුදල් අදාළ කාර්යයන් සඳහා යෙදවීමට පෙර පහත සඳහන් කරුණු අනුගමනය කිරිමට ග්‍රාමශක්ති සමිති වල නිලධාරින් වෙත අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරන්නේ නම් මැනවි.

- ❖ විධායක සභාව සහ සියළුම උප කමිටු පිහිටුවා තිබීම.
- ❖ සමිතිය ලියාපදිංචි විමෙන් පසු අවම වශයෙන් එක් වරක්වත් රැස්වීම් පවත්වා තිබීම.
- ❖ ග්‍රාම නිලධාරි වසමේ සියළුම ක්ෂේත්‍ර නිලධාරින්ගේ සහයෝගය සමිතියට සහය වීමට උපදෙස් ලබාදී තිබීම.

❖ ගණන් තැබීමේ පොත්පත් සහ අනෙකුත් අදාළ මූලික ගිණුම් සටහන් තැබීමට අවශ්‍ය ලේඛන සමිතිය සතුවීම.

❖ සමිති පවත්වාගෙන යාම සඳහා ස්ථිර ස්ථානයක් පැහැදිලිව තෝරාගෙන තිබීම.

❖ ක්‍රියාත්මක කිරීමට තෝරාගත් යටිතල ව්‍යාපෘතිය / ව්‍යාපෘති , ග්‍රාම සංවර්ධන (VDP ) සැලැස්මේ ඇතුලත්ව තිබීම.

❖ තෝරා ගන්නා ලද ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් දිළිඳු පුද්ගලයින් සහ පවුල් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වා තිබීම.

❖ යටිතල ව්‍යාපෘති සඳහා වූ ඇස්තමේන්තු සුදුසු තාක්ෂණික නිලධාරියෙකු ලවා සකස් කර තිබීම.

❖ ජිවනෝපාය සංවර්ධනය සඳහා වූ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සුදුසු මට්ටමට ඉතුරුම් හා ග්‍රාමීය ආයෝජන ප්‍රවර්ධන කමිටුව දැනුවත් වී තිබීම.

❖ ග්‍රාමශක්ති ජනතා සමිතිය පිළිබඳ ඇගයීම් වාර්තාවක් ලබාගෙන ඒ පිළිබඳ නිරික්ෂණයකින් අනතුරුව පමණක් සමිති වෙත ලබාදී ඇති අරමුදල් යෙදවීම සඳහා අනුමැතිය ලබාදීම.

❖ ඇගයීම් වාර්තාව සකස් කිරීමට අවශ්‍ය ක්‍රමවේදය පිළිබඳ අදාළ උපදෙස් කඩිනමින් ඔබවෙත ලබාදීමට කටයුතු කරමි.

ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාමශක්ති ජනතා සමිතිය අතර මූල්‍ය ආවරණ ගිවිසුමක් අත්සන් කිරිමෙන් අනතුරුව ලබාදී ඇති අරමුදල් භාවිතා කිරිමේ බලය ග්‍රාමශක්ති ජනතා සමිතියට හිමිවේ.

මෙයට සේවයට ලැදි,

චන්ද්‍රරත්න පල්ලේගම
ජනාධිපති අතිරේක ලේකම්,
තිරසර සංවර්ධන අංශය

පිටපත් 1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස හා අ.ක.ස.